

ලෙනවර රජමහා විහාරය

## ❊ බොදු පිළිවෙතට පටහැනි පැවතුම් හතක්

– මකුලෑවේ විමල හිමි

තිකිණි පුර අටවක පෝද ධර්ම දේශනාව යටතේ පුද්ගලයාගේ පිරිහීමට හේතුවන; බුද්ධ ශාසනයේ පැවැත්මට අහිතකර ලෙස බලපාන පුද්ගල පැවතුම් හතක් පිළිබඳ සිදු කෙරෙන සමාජ විමර්ශනයකි.

## ❊ වස් කාලය තුළ සපිරිය යුතු ‘අනුත්තරිය ධර්ම’

– දෑදිගම තිලකවංස හිමි

සූත්‍ර පිටකයේ අංගුත්තර නිකායේ මූල පණ්ණසකය නමැති කොටසෙහි සඳහන් අනුත්තරිය ධර්ම සූත්‍රය පිළිබඳ විමසුමකි. වස් කාලය තුළ වැඩිය හැකි ධර්ම කොටසක් ලෙස මෙම ලිපියෙන් මෙම ‘අනුත්තරිය ධර්ම’ හඳුන්වා දී ඇත.

## ❊ දහම් මගෙන් සමත් වන පර හිත පිළිවෙත

– හෙන්රි අලගොඩ

සමාජ සේවය සඳහා පුද්ගලයකු තුළ තිබිය ගුණ ධර්ම හා දක්ෂතා පිළිබඳ විමසුමකි. සමාජ සේවයෙහි නිරතවන හා නිරත වීමට අපේක්ෂා කරන අයට බුදු දහමෙන් ඒ සඳහා ලබාගත හැකි මග පෙන්වීම.

## ❊ වස්සාන සමයේ ශාසනික නවෝදය

– බලංගොඩ ජිනරතන හිමි

වස් සමයේ ක්‍රියාත්මක කෙරෙන සම්ප්‍රදායික ශාසනික පිළිවෙත් නිසා ඇතිවන ශාසනික නවෝදය. වස් සමයේ ඇතිවන ආගමික ප්‍රබෝධය තුළින් ගිහි–පැවිදි සබඳතා වැඩෙන අයුරු.

## ❊ හින්දු සන්‍යාසියකුගේ විදර්ශනා අත්දැකීමක්

– ජෝති අෂීර්

භාරතයේ හින්දු ආගමිකයකු බෞද්ධ විදර්ශනා භාවනාව හදාරා ලද අත්දැකීමක් පිළිබඳ විස්තර.

## ❊ මෙලොවදීම ලද හැකි නිවන් සැපත

– කත්තිමහර සුමංගල හිමි

බෞද්ධ පඩිරුවනක් ලෙස ශ්‍රී ලංකාවේ ප්‍රකට වූ කත්තිමහර සුමංගල හිමියන්ගේ ශිෂ්‍ය හිමිනමක වූ වතුරුගම නන්දසිරි හිමියන් විසින් සපයන ලද – කත්තිමහර සුමංගල හිමියන් විසින් ලියන ලද ලිපියකි. ‘දිට්ඨ ධම්ම නිබ්බාණ’ යන අර්ථයට බුද්ධකාලීන අනෙකුත් ආගමිකයන් විසින් දී තිබූ අරුතට – නව අරුතක් එක් කළ දෙසුමක් පිළිබඳ මෙම ලිපියෙන් කියැවේ. බුදු දහමෙහි දැක්වෙන නිවන් සැපත – මිනිසාට මෙලොව දී ලබාගත හැකි සැපතක් බව – එම දෙසුමෙහි හරයයි.

## ❊ මෛත්‍රී භාවනාවෙන් ලබාදෙන කායික – මානසික සුවය

– රෙජී වීරමන්

බුදු දහමේ දැක්වෙන මෛත්‍රී භාවනාව නිසා මනස තුළ ඇතිවන සුවදායී තත්ත්වය, පුද්ගලයාගේ කායික හා මානසික නිරෝගී බවට බලපාන අන්දම.

## ❊ ලෙනවර රජමහා විහාරය

– චන්ද්‍ර ශ්‍රී පෙරේරා

‘සිත නිවෙන තැන්’ විශේෂාංගය යටතේ කළුතර දිස්ත්‍රික්කයේ බණ්ඩාරගම ප්‍රදේශයට ආසන්නව පිහිටා ඇති ඉපැරැණි ඓතිහාසික විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු.

## ❊ අද අදම වැඩිය යුතු වැඩිය හැකි නිවන් මග

– කමලා අතුකෝරාළ

බෞද්ධ විමුක්ති ප්‍රතිපද මාර්ගය පසු ජීවිතවලට කල් දැමිය හැකි එකක් නොවන බව සහ එය වර්තමාන ජීවිතය තුළදීම ක්‍රියාත්මක කර – පල ලද හැකි එකක් බව.